www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පාර්ලිමේන්තුව විසුරුවාලීමෙන් පසු ශ්‍රී ලංකා ජනාධිපතිනිය මුනිවත රකී

## Sri Lanka's president remains silent after sacking the government

**කේ රත්නායක විසිනි**
**2004 පෙබරවාරි 10**

ශ්‍රී ලංකාව තුල පෙර නො වූ විරූ ආකාරයේ පියවර මගින් ආන්ඩුව පහ කිරීමෙන් අනතුරුව, මෙතෙකුදු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින්, තම ක්‍රියාවන් යුක්තිසහගත කිරීමේ මොන යම් හෝ ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කොට නොමැත. සිව් වසරකටත් අඩු කාලයක් තුල තෙ වන මහා මැතිවරනයකට තුඩු දුන් ඇගේ තීරනය, ව්‍යාපාරික ප්‍රධානීන්ගේ, මාධ්‍ය ටීකාකරුවන්ගේ, හා රජයේ ඇමතිවරුන්ගේ විවේචනයන් අවුලුවාලමින් රට දේශපාලන කලබැගෑනියකට ඇද දමා තිබේ. තමන් අර්බුදය ඇරඹූ නමුදු, කුමාරතුංග විසින් පවත්වාගෙන ඇත්තේ, සිතා මතා ඇති කරගත් නිහැඬියාවකි.

සෙනසුරාදා රාත්‍රියේදී ජනාධිපතිනිය ඇගේ පියවර ගත්තේ, අගමැති රනිල් වික්‍රමසිංහට වත්, ඔහුගේ කිසිදු ඇමතිවරයෙකුට වත් තම අභිප්‍රායයන් පිලිබඳව දැනුම් දීමකින් තොර ව ය. ඒ වන විට දැඩි ආරක්ෂක විධිවිධාන සලසා තිබූ රජයේ මුද්‍රනාලයට ජනාධිපතිනියගේ නියෝග රැගෙන ගියේ රාත්‍රි 10ට වන අතර අවසානයේ දී පාර්ලිමේන්තුව විසුරුවා ඇමුනු බවට නිල ගැසට් නිවේදනය නිකුත් කෙරුනේ රෑ මැදියමේ දී ය.

කෙසේ වුවද, විධිනියමානුකූල ගැසට් නිවේදනය, එම තීරනය පිලිබඳ කිසිදු පැහැදිලි කිරීමක් නො සැපයීය. එය සරලව ම සඳහන් කලේ, පාර්ලිමේන්තුව විසුරුවාලීමට සහ නව මහ මැතිවරනයක් කැඳවීමට ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති ඇගේ විධායක බලතල ජනාධිපතිනිය විසින් ක්‍රියාවට දැමෙන බව ය, විපක්ෂයේ සිටිය දී කුමාරතුංගත් ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් (ශ්‍රිලනිප) විධායක ජනාධිපති බලතල සාමාන්‍යයෙන් හෙලා දුටුවේ ආඥාදායක බලතල ලෙසිනි. ජනාධිපතිනිය වශයෙන් දැන් ඇය, එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව (එජාපෙ) විසුරුවීමට එකී ඒකාධිපති බලතල ම භාවිතා කොට ඇත්තේ එම ආන්ඩුවට තවමත් පාර්ලිමේන්තුවේ බහුතරයක් පැවතිය දී ය.

නිහඬ කුමාරතුංග, තම ක්‍රියාවන් ආරක්ෂා කිරීම සඳහා කරුනු දැක්වීමට ඇයගේ උපදේශකයන්ට ඉඩ හැර සිටී. පාර්ලිමේන්තුව විසුරුවාලීමට යන්තම් පැය කිහිපයකට පෙරාතුව ජනාධිපතිනිය විසින් තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය ධුරයේ පිහිටුවන ලද දි. මු. ජයරත්න කෑගල්ලේ දී පැවැති රැස්වීමක දී පැවසුයේ, "ජාතිය බේරා ගැනීම සඳහා" ඇය විසින් එම තීරනය ගැනුනේ, "හොඳින් හිතා මතා" බව ය.

ආන්ඩුව සමග දිග්ගැසුනු දේශපාලන ආරවුලක් අවුලුවාලමින් නොවැම්බරයේ දී කුමාරතුංග විසින් ප්‍රධාන අමාත්‍යාංශ තුනක පාලනය හදිසියේ ම ඩැහැගත් කල ඉදිරිපත් කෙරුනේ ද මෙම යුක්තිකරනය ම ය. දෙමල ඊලාමයේ විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාම සාකච්ඡාවල දී රටෙහි ආරක්ෂාවට වල කැපීම සහ "රට බෙදීම" සඳහා මං පෑදීම පිලිබඳව ජනාධිපතිනියත් ඇගේ සගයනුත් වික්‍රමසිංහට එහි දී චෝදනා කල හ.

එතැන් පටන් ආරක්ෂක හා අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයන් පාලනය වනු ලැබුනේ කුමාරතුංගගේ පාලනය යටතේ ය. තවද පසුගිය අප්‍රේල් මස සිට ම සාම සාකච්ඡාවන් ඇන හිට තිබිනි. එ කල මෙන් ම මෙ කල ද කුමාරතුංග විසින් ප්‍රතිචාර දැක්වෙනුයේ, රටෙහි දශක දෙකක සිවිල් යුද්ධය අවසන් කිරීම පිනිස දෙමල සුලුතරයට මොන ම හෝ සහනයක් ලබා දීමට එරෙහි වන, මිලිටරි ධුරාවලියේ ද සිංහල ස්වෝත්තමවාදීන්ගේ ද ඉල්ලීම් වලට ය.

රට පාවා දීම පිලිබඳව එජා පෙරමුනු හෙලා දැකීමේ සහ අගමැතිවරයාව පහ කරනු වස් ජනාධිපතිනියට බල කිරීමේ නිරතව සිටි, සිංහල ස්වෝත්තමවාදය මත පදනම් වූ පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුනත් සමග සංධානයක් සඳහා ජනාධිපතිනිය විසින් අවසරය දුන්නේ තෙ සතියකටත් අඩු කලකට පෙරාතුව ය. බරපතල ලෙස ජීවන කොන්දේසි බාදනය කර ඇමූ, ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිසංස්කරනයක් ක්‍රියාවට දැමූ ප්‍රධාන පක්ෂ දෙක ම කෙරෙහි පලල් ව පැතිරුනු මහජන විරෝධය පසුගිය තෙ වසරේ මැතිවරනවල දී ජවිපෙ විසින් ගසා කා ඇත.

ජවිපෙ සමග ශ්‍රිලනිපයේ සංධානය පැහැදිලිව ම පාදක කෙරී ඇත්තේ වික්‍රමසිංහ ආන්ඩුව පාලනයෙන් ඉවත් කිරීම මත ය. සෙනසුරාදා කුමාරතුංග විසින් පාර්ලිමේන්තුව විසිරවනු ලැබුවේ, මැතිවරන කොමසාරිස් විසින් නව ජවිපෙ-ශ්‍රිලනිප පෙල ගැස්ම,

දේශපාලන පක්ෂයක් ලෙස විධිනියමානුකූලව ලියාපදිංචි කිරීමෙන් සහ මැතිවරන කටයුතු සඳහා එහි සලකුන ලෙස සමනලයකුගේ සංකේතය අනුමත කිරීමෙන් හරියට ම දවසකට පසු ව වීම අර්ථභාරි ය.

සංධානය ගොඩ නැගුනේ ශ්‍රිලනිපය තුල ම සැලකිය යුතු විරෝධතාවයක් මධ්‍යයේ ය. එහි පාර්ලිමේන්තු නියෝජිතයන් 45 දෙනෙක්, කුමාරතුංගගේ ක්‍රියාවන්ට එරෙහි වෙමින් පෙත්සමක් අත්සන් කිරීම දක්වා ම දුර ගියේ ය. එහෙත් ඇය ඉදිරියට ම ගියේය යන කරුන වනාහි, සැලකිල්ලට ගතයුතු, පාර්ලිමේන්තුමය හා මැතිවරනමය කරුනු මත  වඩවඩාත් අඩුවෙනුත්, අවසාන විශ්ලේෂනයේ දී මිලිටරිය විසින් සහයෝගී ඇයගේ විධායක බලතල මත වඩා සෘජුවමත් ඇය පාදක වෙමින් සිටින බව පිලිබඳ පැහැදිලි ඇඟවුමකි.

ඇයගේ අඛන්ඩ නිහඬතාවය මධ්‍යයේ, පැහැදිලි කර ගැනීමක් සඳහා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කුමාරතුංගගේ මාධ්‍ය උපදේශක ජනදාස පීරිස්ට දුරකථනයෙන් ඇමතී ය. තම ක්‍රියාවන් පැහැදිලි කිරීමට ජනාධිපතිනිය අසමත් වූයේ මන්ද යන්න විමසූ කල පීරිස් ආරක්ෂාකාරී ලෙස පිලිතුරු දුන්නේ, ඇය “බොහෝ විට” අද ජාතික රූපවාහිනියෙහි පෙනී සිටිනු ඇතැයි පවසමිනි. එහෙත් ඔහුට ඒ පිලිබඳව සහතිකයක් නො වී ය.

ජනාධිපතිනියගේ නිහැඬියාව, ඇයගේ බොනපාට්වාදී පියවරයන් වනාහි පාලක පන්තිය තුල ගැඹුරු විභේදනයන්ගේ ප්‍රතිඵලය ය යන කරුන අවධාරනය කරයි.

පසුගිය තෙ මස පුරාවට ම කොලඹ සංගත නායකයන් විසින් අවධාරනය කෙරෙනු ලැබෙමින් පැවැතුනේ, සාම සාකච්ඡා ඉදිරියට ගෙන යාමත් යුද්ධය අවසන් කිරීම සඳහා එල්ටීටීඊය සමග ගනුදෙනුවකට එලැඹීමත් සහතික කිරීමෙහි ලා කුමාරතුංගට හා වික්‍රමසිංහට සම්මුතියකට හා සහයෝගීතාවයකට එලැඹෙන ලෙස ය. තිරයට පිටුපසින් ප්‍රධාන බලයන්, විශේෂයෙන් ම එක්සත් ජනපදය එසේ කරනු වස් ජනපතිනියට පීඩනය යොදනු ලැබෙමින් පැවතුනි.

අනෙක් අතට, ජවිපෙ සමග සංධානයක් ඉල්ලා සිටි ඇගේම පක්ෂය තුල සිටින්නන් සේ ම සන්නද්ධ හමුදාවන් හි බලවත් කොටස් ඇතුලත් සිංහල ස්වෝත්තමවාදීහු එල්ටීටීඊය සමග මොනයම් හෝ එකඟතාවයකට, කර්කශ ලෙස විරුද්ධ වූ හ.

සාර්ථකත්වයක් අත්පත් කොට ගත හැකි නම්, ජනාධිපතිනියගේ මෑත ම ක්‍රියාවන්හි ප්‍රතිඵලය විය හැක්කේ, එල්ටීටීඊය සමග සාම සාකච්ඡා නවතා රට නැවත යුද්ධයට ඇද දැමීමට බොහෝ කොට ම ඉඩ ඇති, ශ්‍රිලනිප-ජවිපෙ ආන්ඩුවකි. කුමාරතුංග දෙගිඩියාවකින් පසු වන්නේ, පෙරදී තමාට පිටුබලය දුන් ව්‍යාපාරිකයන් හා ප්‍රධාන බලවතුන්, විශේෂයෙන් ම වොෂිංටනය ඉදිරියේ තම ක්‍රියා පිලිවෙත සාධාරනීකරනය කරන්නේ කෙසේද යන කරුන මත ය. මේ අනුව ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා මේ සා දිගු කාලයක් ගත වීම එතරම් පුදුමයක් නොවේ.

ඕනෑම සිද්ධියකදී, ක්‍රියාවන් වචනවලට වඩා ශබ්ද නගා කතා කරයි. කුමාරතුංගගේ ව්‍යවස්ථාමය කුමන්ත්‍රනය, ශ්‍රී ලාංකික සමාජය විනාශමුඛයට ඇද දමනු ලබන ආර්ථික හා සමාජමය පරස්පර විරෝධයන්ගේ ගැඹුර පිලිබඳව වෙලුම් ගනනාවක් කතා කරයි. එමගින්, ශ්‍රී ලාංකික පාලක පන්තිය පැරනි ආකාරයේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයෙන් සීඝ්‍ර ලෙස බැහැර වෙන බවට අනතුරු ඇඟැවේ.

© www.wsws.org